Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව සබරගමුව - සති පාසල**

**විෂය - විද්‍යාව**

**සතිය- දෙසැම්බර් 3 සතිය**

**9 ශ්‍රේණිය**

**සැකසුම - සන්ධ්‍යා රූපසිංහ**
**ර/නිවි./ ඇලපාත මහා විද්‍යාලය**

මෙම කොටස අධ්‍යයනයෙන් ,

- ස්වභාවික සම්පත් පිළිබඳව ,
- මැණික් වල විශේෂ ලක්ෂණ හා ගුණ ,
- ශාක වල ප්‍රයෝජන හා භාවිත ,
- ස්වභාවික සම්පත් වල වටිනාකම හඳුනා ගත හැක .

01. ස්වභාවික සම්පත් යනු මොනවාද ? ඒ සඳහා නිදසුන් ලියන්න.

02. ජලය අපට ඇති ප්‍රධාන ස්වභාවික සම්පතකි. ජලය අතීතයේ තිරසාරව භාවිතා කළ ආකාර 2ක් ලියන්න .

03. ඛනිජ හා පාෂාණ හඳුන්වා නිදසුන් 2 බැගින් ලියන්න .

04. ලංකා සිතියමක් ආධාරයෙන් ඛනිජ සම්පත් පැතිරී ඇති ප්‍රදේශ අධ්‍යයනය කරන්න .

05. මැණික් ලංකාවේ ඇති වටිනා ඛනිජ වේ. පහත ක්‍රියා සඳහා තනි වචන ලියන්න .
    - මැණික් සහිත පස් තට්ටුව
    - මැණික් ලබා ගැනීමට හාරන වල
    - එම වලෙහි සමාන්තරව කපන උමග
    - පස් මිශ්‍රණයෙන් මැණික් ඉවත් කරන ක්‍රමය

06. මැණික් වල ලාක්ෂණික ගුණ 4ක් ලියන්න .

07. ඛනිජ වල දැඩි බව මනින පරිමාණය කුමක්ද ?

08. දැඩිබව වැඩිම සහ අඩුම ඛනිජය නම් කරන්න .
    එහි අගය ලියන්න .

09. ‘කොරන්ඩම්’ ගණයට අයත් වන මැණික් වර්ග මොනවාද ?

10. මැණික් හඳුනා ගැනීමේදී වර්තනාංකය වැදගත් වේ. වර්තනාංකය යනු කුමක්ද ?

11. කපා ඔබ දැමූ මැණික් වලට දිස්නයක් ලැබෙන්නේ කෙසේද?

12. මැණික් කර්මාන්තය ආශ්‍රිත ගැටලු විශාල ප්‍රමාණයක් ඇත. එයින් 5ක් ලියන්න .

13. ශාක මගින් ජීවීන්ට හා පරිසරයට ලැබෙන සේවා අතිමහත්ය. ඒවායින් 10ක් ලියන්න .

14. ශාක පිළිබඳ පහත වගුව පුරවන්න .

| **කාර්යය** | **ඒ සඳහා යොදා ගන්නා ශාක වර්ග** |
|---|---|
| ආහාර සඳහා | |
| පාන සඳහා | |
| ඖෂධ සඳහා | |
| කඩදාසි නිපදවීම | |
| කුළුබඩු සඳහා | |
| රූපලාවණ්‍ය ද්‍රව්‍ය සඳහා | |

15. ශාක වලින් ලබාගන්නා ප්‍රධාන ප්‍රයොජනයකි දැව . දැව සතු විශේෂ ලක්ෂණ 3ක් ලියන්න .

16. විශේෂ ලක්ෂණ අනුව විවිධ කාර්යයන් සඳහා විවිධ දැව වර්ග භාවිතා කරයි. පහත සඳහන් දැව භාවිතා කරන අවස්ථා ලියන්න .
    - කොස් , ලුණු මිදෙල්ල , දොඹ

17. දැව දිරායාමට හේතු මොනවාද ?

18. දැව දිරාපත් වීම වැලැක්වීමේ ක්‍රම මොනවාද ?
    එම ක්‍රම විස්තර කරන්න .